පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

2026.08.

**ගරු කථානායකතුමා,**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.

**<u>අධිකරණය පද්ධතියේ ගොඩගැසෙමින් ඇති නඩු කටයුතු කඩිනම් කිරීම සඳහා යෝජනා ලබාගැනීමට පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම සම්බන්ධවයි</u>**

නඩු ප්‍රමාදය හේතුවෙන් ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ මේ වනවිට ගොඩගැසී ඇති මුළු නඩු සංඛ්‍යාව මිලියන 1.1 කට වඩා අධික බව අධිකරණ අමාත්‍යාංශයේ දත්ත වාර්තා පෙන්වා දී තිබේ.

නඩු ප්‍රමාණයට සාපේක්ෂව විනිසුරු පුරප්පාඩු සම්පූර්ණ කර නොමැතිවීමත්, නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීමත්, රජයේ රසපරීක්ෂක වාර්තා, රජයේ තක්සේරු වාර්තා ප්‍රමාදවීමත් මෙම නඩු ප්‍රමාදයට හේතුවක් බව පැහැදිලිව පෙනෙන්නට තිබේ.

නීතිපති දෙපාර්තමේන්තුව හමුවේ අධික රාජකාරි ප්‍රමාණයක් ගොඩගැසී තිබීමත්, එම දෙපාර්තමේන්තුව හරහා සිදුවන ප්‍රමාදයන් පිළිබඳ ගැටළු සහගත තත්ත්වයන් හී අඛණ්ඩතාවත්මෙම ගැටළුවට හේතුවක් බව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය හර්ෂණ නානායක්කාර මහතා ද පාර්ලිමේන්තුවේදී පිළිගන්නා ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද නීතිපති දෙපාර්තමේන්තුව තුළ ඇති ප්‍රමාදයන් පිළිබඳ අවස්ථා ගණනාවකදී ඉස්මතු කර ඇති අතර, එය අධිකරණ පද්ධතියේ ප්‍රමාදයන්ට ප්‍රධාන බාධකයක් ලෙස හඳුනාගෙන තිබේ. එමෙන්ම ආසන්න කාලසීමාව තුළ බන්ධනාගාර ගැටුම් කිහිපයක් අපට අසන්නට ලැබුණු අතර ඊට ද මෙම නඩු කටයුතු ප්‍රමාදයන් හේතුවක් බව පැහැදිලිව පෙනෙන්නට තිබේ.

ශ්‍රී ලංකාව පුරා සමස්ත බන්ධනාගාර තුළ ඉඩකඩ ප්‍රමාණවත් වන්නේ රැඳවියන් 10,000කට පමණි. එහෙත් මේ මොහොත වනවිට එම බන්ධනාගාර තුළ රඳවා සිටින රැඳවියන් ප්‍රමාණය 40,000කට අධිකය. ඒ අනුව ඔවුන්ගේ පෞද්ගලික අවශ්‍යතා, ආහාර සහ සනීපාරක්ෂාව පිළිබඳව ද බරපතල ගැටළුවක් නිර්මාණය වී තිබේ. එම ගැටළු ඇතැම්විට ගැටුම් දක්වා ද වර්ධනය වන අයුරු අපට අසන්නට ලැබේ.

බන්ධනාගාර දෙපාර්තමේන්තු දත්තවලට අනුව, බන්ධනාගාරගතව සිටින රැඳවියන්ගෙන් 75%ක් පමණ පිරිසක් තවමත් නඩු කටයුතු අවසන් නොවීම හේතුවෙන් බන්ධනාගාර ගතවූ පිරිස්ය.

එමෙන්ම තවත් පිරිසක් තමන්ට නියම වූ දඩ මුදල ගෙවාදැමීමට මුදල් නොමැතිවීම හේතුවෙන් යළිත් බන්ධනාගාරගත කර සිටී. එය බන්ධනාගාර ප්‍රශ්නයකට එහා ගිය, "දුප්පත්කමට නිසා දඬුවම් ලැබීමේ" ප්‍රශ්නයක් බවට පෙන්වා දිය හැකිය. මුදල් ඇති පුද්ගලයින් ඇප ලබා එළියට යද්දී ඇප තැබීමට මුදල් නොමැතිවීම හේතුවෙන් තවත් පිරිසක් බන්ධනාගාර තුළම රැඳී සිටීමට හේතුවීම සමාජයීය ප්‍රශ්නයක් වී තිබේ.

එබැවින් ඇප නීතියේ පවතින දුර්වලතා, රජයේ රසපරීක්ෂක වාර්තාවල ප්‍රමාදයන්, රජයේ තක්සේරු වාර්තාවල ප්‍රමාදයන් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ ගැටළුවලට වහාම විසඳුම් සෙවීමත්, දඩ ගෙවා දැමීමට නොහැකිව බන්ධනාගාර ගතවන පුද්ගලයින්ට විකල්ප දඬුවම් ක්‍රමවේදයක් හෝ සුදුසු පරිදි ඔවුන් සමාජගත කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමත් කාලීන වැදගත්කමකින් යුක්ත බව අවධාරණය කරමු.

ඒ අනුව නඩු ගොඩගැසීමට හේතු සහ ඊට කෙටිකාලීන, මැදිකාලීන සහ ස්ථිරසාර විසඳුම් සෙවීමත්, බන්ධනාගාර තදබදය අවම කිරීමට මෙන්ම බන්ධනාගාර තුළ සිදුවන ගැටුම්වලට තිත තැබීමට ගතයුතු ස්ථිරසාර විසඳුම් වහාම යෝජනා කිරීම සඳහා ස්ථාවර නියෝග 100 – 110 අනුව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කරන ලෙස ඉල්ලා සිටිමු.